**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 01 – 2020**
**---------------------------------------------------------------------------------**

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- අදියර 01 හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ණය ගිවිසුම් අංක 3267 – (එස්ආර්අයි) හි 4.06(අ) වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2015 සැප්තැම්බර් 17 වන දින එළඹි ණය ගිවිසුම් අංක 3268 – එස්ආර්අයි (එස්එෆ්) හි 4.03 (අ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**
**------------------------------------------------------------------------------------**

වැඩසටහනේ ණය ගිවිසුම අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 28,713කට සමාන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 190 ක් වූ අතර, ඉන් රුපියල් මිලියන 22,668කට සමාන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 150ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යයනය කිරීමට එකඟත්වය පළ කර ඇත. රුපියල් මිලියන 6,045ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යයනය කිරීමට අපේක්ෂා කර ඇත. මෙම වැඩසටහනෙහි කටයුතු 2015 ජූනි 24 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට එය නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේවුවද, මෙම වැඩසටහනෙහි කාර්යය නිමකළ යුතු කාලය 2022 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**
**-----**

වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**
**----------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි විය හැකි බව අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** භෞතික කාර්යසාධනය

**2.1** වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ප්‍රධාන සංරචක 03ක් යටතේ වැඩසටහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කළ අතර කාර්යයන්වල භෞතික ප්‍රගතිය පහත විස්තර කර ඇත.

| සංරචක | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණ | බලපෑම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත ප්‍රගතිය ප්‍රතිශතය | ළඟාකර ගත් කාර්යසාධනය ප්‍රතිශතය | | | |
| ඉහළ ඇලහැර ඇල ඉදිකිරීම | 87 | 55 | කොන්ත්‍රාත්කරු විසින් තාවකාලිකව වැඩ නතර කිරීම සහ පිරිනමන ලද කොන්ත්‍රාත්තුවේ මන්දගාමී ප්‍රගතිය | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල අනපේක්ෂිත ප්‍රමාදයන්. එම අතිරේක අරමුදල් අවශ්‍යතා ඇති විය හැකි වීම. තවද, එය කෘෂිකාර්මික කටයුතු සඳහා ද බලපෑමක් ඇති විය හැක. | කොන්ත්‍රාත්තුව යටතේ පවතින ක්‍රියාකාරකම්වල ප්‍රමාදයන් සහිතව ආරම්භ කිරීම |
| වයඹ පළාත් ඇළ ඉදිකිරීම | 81 | 47 | කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාදයන් සහ පිරිනමන ලද අනෙක් කොන්ත්‍රාත් 02 හි වැඩවල මන්දගාමී ප්‍රගතිය | සම්බන්ධිත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම | වැඩ සැළසුම්කරණයේ දුර්වලතා සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු |
| මිනිපේ වම් ඉවුර ඇල පුනරුත්ථාපනය | 100 | 71 | කොන්ත්‍රාත්කරු විසින් කොත්ත්‍රාත් වැඩ ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතිය | සම්බන්ධිත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම | සිවිල් වැඩ ඉදිකිරීම් සැළසුම්කරණයේ දුර්වලතා |

| | |
|---|---|
| කළමනාකරණයේ අදහස් දැක්වීම | ඉහළ ඇලහැර ඇල, වයඹ පළාත් ඇල සහ මිනිපේ වම් ඉවුරු ඇල ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය 2020 මැයි 31 දිනට පිළිවෙළින් සියයට 59, 55 හා 79 ක් ළඟා කරගෙන තිබුණි. |
| විගණකගේ නිර්දේශය | ව්‍යාපෘතිය විසින් නියම කර ඇති කාල සීමාව තුළ පිරිවැය සඵලදායී ලෙස කාර්යයන් නිම කිරීමට හැකිවන පරිදි නිම කිරීමට කොන්ත්‍රාත් පැකේජය යටතේ ඇති සිවිල් ඉදිකිරීම් වැඩ සමීපව නියාමනය කිරීම අවශ්‍යවේ. |

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ) වැමැඩිල්ල වම් ඉවුරු ඇල වැඩිදියුණු කිරීම සහ වයඹ ඇල ඉදිකිරීම යටතේ සොරොව්ව හා වාන් ඇල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් කාලසීමාව **2018** දෙසැම්බර් **27** දිනෙන් අවසන් විය යුතුවේ. **2021** ජනවාරි **06** දක්වා කාල දීර්ඝයක් දී ඇත. කෙසේවුවද, **2020** දෙසැම්බර් **31** වන විට අපේක්ෂිත ප්‍රගතිය වූ සියයට **100** න්, සියයට **92** ක් ලඟා කරගෙන තිබුණි. සැලසුම් සහ ඇස්තමේන්තු පිලියෙළ කිරීමේ දුර්වලතා හේතුවෙන් රුපියල් මිලියන **154.6**ක කොන්ත්‍රාත් විචලනයක් නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවීම | **2021** අප්‍රේල් **30** වන විට, සියයට **95**ක භෞතික ප්‍රගතියක් සමඟ ව්‍යාපෘතිය නිමකර ඇත. පවතින ජල ගැටළු හේතුවෙන් කොන්ත්‍රාත්කරුට භෞතික වැඩ සම්පූර්ණ කිරීම සඳහා **2020** අගෝස්තු **30** දක්වා සහන කාලයක් ලබා දුනි. මහවැලි උපදේශන කාර්යාංශය විසින් සැලසුම් සහ ඇස්තමේන්තු සාදන ලද, මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ කොන්ත්‍රාත් පැකේජයේ අත්තිකාරමක් ලෙස මෙය ගන්නා ලදී. **2016** දී කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවි සංවිධාන ඉල්ලුම් කළ විවිධ අවශ්‍යතා සමඟ ඉදිකිරීම් සිදු කළ හෙයින් සැළසුම් වෙනස්කම් සමඟ විචලනයන් සිදුවිය. | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීමට කටයුතු කළ යුතු වීම |
| ආ) වයඹ පළාත් ඇළ ඉදිකිරීම යටතේ නාබඳගහවත්ත සිට මහකිතුල ජලාශ ඇතුළු උමග දක්වා වන ප්‍රධාන ඇල **2020** දෙසැම්බර් **31** වන විට සියයට **93**ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කර තිබුණද, ළඟා කරගෙන තිබුණේ සියයට **41**ක ප්‍රගතියක් පමණි. උපදේශක ප්‍රගති වාර්තාව අනුව, ඇස්තමේන්තුගත ප්‍රමාණයන් ඉක්මවා යාම හේතුවෙන් රුපියල් මිලියන **7,226.6** වූ කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන **1,413** කින් වැඩිවී තිබුණි. | කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවීම | මූලික අදියරේදී කොන්ත්‍රාත්කරු සැළසුම් කළ ආකාරයට විධිමත්ව සූදානම් වී නොතිබුණි. ශ්‍රමය සහ යන්ත්‍රෝපකරණ පැවතීම දියුණු කිරීම සහ වැඩබිමට ප්‍රධාන පුද්ගලයින් යොමුකිරීමටත් විවිධ සාකච්ඡා පැවැත්විණි. ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් ඇතිවී තිබූ අතර විශේෂයෙන්ම ඉඩම් කොටස් **10**ක් **2018** වර්ෂයේ සිට ඉඩම් අත්පත් කරගැනීමේ අභියාචනා මණ්ඩලයේ පවතී. හිමිකම් මාර්ගයේ සහ වනජීවී ප්‍රදේශවල ව්‍යුහයන් ඇති කිරීමට සමහර සැළසුම් වෙනස්කම් සිදුකිරීම ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තුගත ප්‍රමාණ වැඩි විය. | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| ඇ) | කිලෝමීටර් **0+100** සිට **3+860** දක්වා ඉහළ ඇලහැර ඇළ ඉදිකිරීම **2020** ජනවාරි **08** දින නිම කළ යුතුවේ. අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට **95**ක් විය. කෙසේවුවද, **2020** දෙසැම්බර් **31** දිනට සත්‍ය ප්‍රගතිය සියයට **63** ක් පමණක් විය. උපදේශක ප්‍රගති වාර්තාව අනුව, ඇස්තමේන්තුගත ප්‍රමාණයන් ඉක්මවා යාම හේතුවෙන් රුපියල් මිලියන **3,742** ක් වූ කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන **658.5** කින් වැඩිවී තිබුණි. | කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවීම | මෙම කොන්ත්‍රාත්තුව **2016** නොවැම්බර් **11** දින **CML-MTD** ඉදිකිරීම් සමාගමට ප්‍රදානය කළ අතර ව්‍යාපෘතියේ මුල් නිමකිරීම **2020** ජනවාරි **08** දින විය. මුල් කොන්ත්‍රාත්තුවේ මිල රුපියල් මිලියන **3,742** කි. ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව කරගෙන යන අතරතුර, පහත සඳහන් හේතූන් මත පාෂාණ කැණීම් - පිරිවැය ඇස්තමේන්තු කිරීමට පෙර සිදු කරන ලද සීමිත ස්ථාන විමර්ශනය හේතුවෙන් සොයා ගෙන නොමැති සත්‍ය ස්ථාන තත්ත්වය අනුව ද්‍රව්‍ය ප්‍රමාණය වැඩි කිරීමට නියමිත බව සටහන් විය. | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීමට කටයුතු කළ යුතුවේ. |
| ඈ) | මිනිපේ වම් ඉවුරු ඇල ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය යටතේ මිනිපේ වම් ඉවුරු ඇළ - (අදියර **1**) ප්‍රතිසංස්කරණය ඉදිකිරීම් කාල සීමාව **2018** ඔක්තෝම්බර් **13** දින නිම වේ. කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් කාලසීමාව තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපොහොසත් වීම නිසා ව්‍යාපෘති කාලසීමාව **2020** දෙසැම්බර් **20** දින දක්වා දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්තුවේ විෂය පථයේ වෙනස්කම් නිසා කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන **408.6** සිට රුපියල් මිලියන **568.6** දක්වා සියයට **40**කින් ඉහල ගොස් ඇත. **2020** දෙසැම්බර් **20** දින කාල දිගුව අවසන් වුවද, ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. **2020** දෙසැම්බර් **31** දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට **100** න් අද වන විට සියයට **97**ක ප්‍රගතියක් ළඟා කරගෙන තිබුණි. | කොන්ත්‍රාත් පිරිවැය ඉක්මවීම | **2021** අගෝස්තු මීළඟ ජල වැසුම් කාලසීමාව වන විට මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුවේ. | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීමට කටයුතු කළ යුතුවේ. |
| ඉ) | මිනිපේ වම් ඉවුරු ඇල ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් කාලසීමාව (අදියර **3**) යටතේ මිනිපේ වම් ඉවුරු ඇළ ප්‍රතිසංස්කරණ කාල සීමාව **2019** අප්‍රේල් **26** දින නිම කල යුතුවේ. කොන්ත්‍රාත් කාලසීමාව තුළ | වැඩසටහන් පිරිවැය ඉක්මවීම | **2021** මැයි **31** දිනට භෞතික ප්‍රගතිය සියයට **86**කි. **2021** අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා මීළඟ ජල වැසුම් කාලසීමාවෙන් පසුව ඉතිරි වැඩ නිම කරනු ලබයි. | ඉදිකිරීම් වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම් වැඩ නිමකිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම නිසා කොන්ත්‍රාත් කාලසීමාව 2020 ඔක්තෝම්බර් 20 දක්වා දීර්ඝ කර තිබුණි. නමුත් දීර්ඝ කළ කාලසීමාව තුළද වැඩ නිම කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 75 ක් පමණක් විය. | | | |
| ඊ) | මිනිපේ වම් ඉවුරු ඇල ප්‍රතිසංස්කරණය යටතේ මැනුම් පහසුකම් සහ ජල පාලනය ඇතුළුව මිනිපේ සොරොව්ව උස්කිරීමේ කොන්ත්‍රාත් කාලසීමාව 2020 නොවැම්බර් 12 දින නිම කළ යුතුවේ. කොන්ත්‍රාත් කාලසීමාව තුළ ඉදිකිරීම් වැඩ නිමකිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම නිසා කොන්ත්‍රාත් කාලසීමාව 2021 ජනවාරි 07 දක්වා දීර්ඝ කර තිබුණි. නමුත් දීර්ඝ කළ කාලසීමාව තුළද වැඩ නිම කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 50ක් පමණක් විය. | වැඩසටහන් පිරිවැය ඉක්මවීම | 2021 මැයි 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 61 කි. 2021 දෙසැම්බර් 31 දින මෙම කොන්ත්‍රාත්තුව නිම කිරීමට නියමිතය. | ඉදිකිරීම් වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය |
| උ) | 2015 – 2017 දක්වා ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළ පද්ධති කාර්යක්ෂමතාව සහ ජල ඵලදායීතාව වැඩිදියුණු කිරීමේ උපදේශන සේවා 2020 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණි. | වැඩසටහනේ අවසන් ප්‍රතිලාභ සහ ජල සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් අහිතකරව බලපානු ලැබේ. | පද්ධති කාර්යක්ෂමතාව සහ ජල ඵලදායීතාව වැඩිදියුණු කිරීමේ උපදේශන සේවා 2015- 2017 දක්වා ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණි. කෙසේවුවද, නොවැළැක්විය හැකි හේතු නිසා 2018 ඔක්තෝම්බර් 18 දින උපදේශන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර අත්සන් කළ ගිවිසුම ප්‍රකාරව එය 2020දී අවසන් කිරීමට නියමිතය. | අදාළ කාලසීමාව තුළ ප්‍රමාදයකින් තොරව උපදේශන සේවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |
| ඌ) | වැඩසටහන අඩුම තුන් අවුරුදු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සහ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම ඊළඟ වර්ෂය සඳහා පිළියෙළ කළ යුතුවේ. නමුත් වැඩසටහන විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සහ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. | වැඩසටහන් අරමුණු ළඟා කරගත නොහැකි වීම | මාස 18 ප්‍රසම්පාදන සැලැස්ම පහසුකම් කළමනාකරණ අත්පොතේ ඇතුළත් ය. එය අද වනවිට යාවත්කාලීනව පවතින අතර ඊළඟ වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කරනු ලැබේ. | ඊළඟ වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කිරීම කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| එ) | ප්‍රධාන නේවාසික ඉංජිනේරු සහ නේවාසික ඉංජිනේරු හට පොල්පිතිගම ව්‍යාපෘති කාර්යාලයේ කාර්යාල පහසුකම් සපයා තිබුණද, සමාලෝචිත වර්ෂයේ පෞද්ගලික ගොඩනැගිලි **03**ක් රුපියල් **2,160,000**ක පිරිවැයකට බද්දට ගෙන තිබුණි. | වැඩසටහන් පිරිවැය ඉක්මවීම | ව්‍යාපෘති වැඩබිම පොල්පිතිගම කාර්යාලයට දුරින් පිහිටා ඇත. මෙහෙයුම් වියදම් අවම කිරීමට හා ප්‍රවාහන කාලය ඉතිරි කිරීම සඳහා ගොඩනැගිලි බද්දට ගෙන ඇත. පවතින වැඩබිම අවසන් වූ විට, ඔවුන් පොල්පිතිගම කාර්යාලයට මාරුවෙනු ඇත. | වැඩසටහන අනාර්ථික වියදම් අවම කළ යුතුය. |
| ඒ) | දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් හට ඉඩම් සඳහා වන්දි ගෙවීම් සඳහා ගෙවූ මුදල් සම්බන්ධයෙන් වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය හෝ වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් විධිමත් ගිණුම්කරණ තොරතුරු පද්ධතියක් නඩත්තු කර නොතිබුණි. **2018** දෙසැම්බර් වන විට ව්‍යාපෘති ගිණුම් සහ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අතර රුපියල් මිලියන **21.4** ක වෙනසක් පැවතුණි. **2021** ජනවාරි **20** වන විට එම වෙනසට හේතු විගණනයට හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල වියදම් වැඩිපුර සඳහන් වේ. | වෙනසට සැසඳීම් සති **02**කින් පිළියෙළ කරන අතර විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. | වෙනසට හේතු හැකි ඉක්මනින් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| ඔ) | **2020** දෙසැම්බර් **31** වනවිට ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතියට අදාළව ඉඩම් කැබලි **741**ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කළත්, කිසිදු ඉඩම් කැබැල්ලක් අත්පත් කරගෙන නොතිබුණි. තවද වයඹ ඇළ ව්‍යාපෘතියට අදාළව ඉඩම් කැබලි **961**ක් අත්පත් කරගැනීමට අපේක්ෂා කර තිබුණද ඉඩම් කැබලි **947**ක් **2020** දෙසැම්බර් **31** වන විට අත්පත් කරගෙන තිබුණි. කෙසේවුවද, **2020** දෙසැම්බර් **31** දිනට කිසිදු ඉඩම් කැබැල්ලක් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ **44** කොටස යටතේ ලියාපදිංචි කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ප්‍රමාද වීම | මූලිකව ඉඩම් කැබලි **941**ක් හඳුනා ගත්තද අදවන විට එය ඉඩම් කැබලි **741**ක් දක්වා අඩු කර ඇත. මෙයට ප්‍රධාන හේතු වී ඇත්තේ ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ (2 කොටස) මූලික ඉඩම් මැනීම ඉඩම් අත්පත් කර ගැනීම මගින් රජයට අයත් ඉඩම් කැබලි හඳුනා ගැනීමයි. අද වනවිට වන්දි ගෙවීමේ ක්‍රියාවලියේ අවසන් අදියරට ළඟා වී ඇතත්, විවිධ අමාත්‍යාංශවල විවිධ ආයතන නිරත වන ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය දැඩිව වන්දි ගෙවීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීමට බලපායි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.3 පද්ධති හා පාලනයන්**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ) වැඩසටහන අක්මුදල් අරමුදල් ගිණුම් කාලීනව ප්‍රතිපිරවීම් කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට අංක 3267 අක්මුදල් ගිණුම් ශේෂය ඇමෙරිකන් ඩොලර් 458ක් හා අංක 3268 ගිණුමේ ශේෂය ඇමරිකන් ඩොලර් 821ක් පමණක් විය. එබැවින් නියමිත දිනට කොන්ත්‍රාත් ගෙවීම් කිරීමට වැඩසටහන අපොහොසත් විය. 2020 නොවැම්බර් 30 දක්වා ප්‍රමාද ගෙවීම්වලට රුපියල් 8,696,899ක මූල්‍ය ගාස්තු කොන්ත්‍රාත්කරු විසින් අයකරගෙන තිබුණි. | ප්‍රමාද ගෙවීම්වලට මූල්‍ය ගාස්තු අයකිරීම් කළ හැකි වීම | කොන්ත්‍රාත්කරු විසින් කළ ඉල්ලීම තවමත් උපදේශක විසින් විශ්ලේෂණය කර නොතිබුණි. උපදේශකගේ නිර්දේශයෙන් පසුව, පියවර ගනු ලැබේ. මෙයට හේතු වී ඇත්තේ මූල්‍ය කේත අංක 17 යටතේ මහා භාණ්ඩාගාරය විසින් වේලාවට අක්මුදල් නිදහස් නොකිරීමයි. | වැඩසටහන අක්මුදල් අරමුදල් ගිණුම් කාලීනව ප්‍රතිපිරවීම් කළ යුතු අතර ප්‍රමාදයකින් තොරව නියමිත දිනට කොන්ත්‍රාත් ගෙවීම් කල යුතුය. |
| ආ) ආපසු ගැනීමේ අයදුම්පත මගින් වටිනාකම යූරෝ 81,100.29 ක් වූ ඉන්වොයිසියට ඇමරිකන් ඩොලර් 81,100.29ක් ගෙවා තිබුණි. කෙසේනමුත් ඉන්වොයිසියේ ගණනය කිරීම් සඳහා සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | ඌන හෝ අධි ගෙවීම් ඇති විය හැක. | විගණනය සඳහා අංක 387 ආපසු ගැනීමේ අයදුම්පතට අදාළ සියළු ගණනය කිරීම් පැවතුණි. | නිවැරදි ඉන්වොයිසි හා අදාළ මුදල් ඒකක අනුව සියළු ගෙවීම් කළ යුතුය. |